රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 35 / 2013

මගේ අංකය:- EST-1/MISCL/06/0032(1)
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ - 07

2013.12.23

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

**මතු පරපුර වෙනුවෙන් ජාතික සමගිය තහවුරු කරමින්**
**සමාජ හා ආර්ථික සංවර්ධනයක් ඇති කිරීම සඳහා කැපවෙමු**

"මහජන සේවාවන් විශිෂ්ට ලෙස සැපයීම තුළින් ජනතා අපේක්ෂාවන් මල්පල ගන්වමු" මැයෙන් 2012.12.19 වෙනි දින නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 19/2012 කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

02. මතු පරපුර වෙනුවෙන් ජාතික සමගිය තහවුරු කරමින් සමාජ හා ආර්ථික සංවර්ධනයක් ඇති කිරීම සඳහා වැඩ කිරීමේ ආකල්පමය වෙනසක් සියලුම රාජ්‍ය සේවකයන් තුළ ඇති කිරීමේ අවශ්‍යතාව අවධාරණය කරමින් 2014 වසරේ වැඩ කරන පළමු දිනය වන 2014 ජනවාරි මස 01 වන බදාදා දින සියලුම රාජ්‍ය සේවකයන්ගේ සහභාගීත්වයෙන් විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

03. එහි ප්‍රධාන නිල උත්සවය ජනාධිපති ලේකම්ගේ ප්‍රධානත්වයෙන් එදින පෙ.ව. 9.00ට ජනාධිපති කාර්යාල පරිශ්‍රයේ දී පැවැත්වේ. ඊට සමගාමීව එදින එම වේලාවටම මෙම වැඩසටහන ජාතික, පළාත්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටම නියෝජනය කරන සියලුම රාජ්‍ය ආයතන සහ කාර්යාලවල පැවැත්වීමට ක්‍රියා කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන වැඩපිළිවෙළ යොදා ගත යුතු වේ.

I. සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයන් ඉදිරිපිට දී ආයතනයෙහි හෝ කාර්යාලයෙහි ප්‍රධානියා ජාතික ධජය එසවීම. (සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයන් එක් තැනකට ඒකරාශී කරවීමට බාධා පමුණුවන ඉඩකඩ පිළිබඳ යම් ප්‍රශ්නයක් වෙතොත්, සෑම සාමාජිකයෙකුගේ ම සහභාගිත්වය සහතික කෙරෙන පරිදි සුදුසු විකල්ප වැඩපිළිවෙළක් යොදා ගත හැකි ය.)


II. ජාතික ධජය එසවීමෙන් අනතුරුව ජාතික ගීය ගායනා කිරීම.

III. රණවිරුවන් ඇතුළුව දේශය වෙනුවෙන් දිවි කැප කළ සියලු දෙනා සැමරීම සඳහා විනාඩි 02ක නිශ්ශබ්දතාවක් ආරක්ෂා කිරීම.

IV. සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයන් තම තමන්ට පහසු භාෂාවකින් (මේ සමග එවා ඇති) රාජ්‍ය සේවා ප්‍රතිඥාව/ දිවුරුම හඬ නගා කියවීම.

V. මෙම වැඩපිළිවෙළෙහි අවසාන අංගය ලෙස ආයතනයේ ප්‍රධානියා විසින් මතු පරපුර වෙනුවෙන් ජාතික සමඟිය තහවුරු කරමින් සමාජ හා ආර්ථික සංවර්ධනයක් ඇති කිරීම සඳහා කාර්ය මණ්ඩලයේ සෑම දෙනාගේම දායකත්වය අවංකව, අප්‍රමාදව සහ දැඩි කැපවීමකින් යුතුව ලබාදීමේ අවශ්‍යතාව තේමා කරගත් කෙටි දේශනයක් පැවැත්වීම.

04. මෙම වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා මූලිකත්වය ගෙන කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.



පී.බී. අබේකෝන්
ලේකම්
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

පිටපත් - ගරු පළාත් ආණ්ඩුකාරවරුන්

# රාජ්‍ය සේවයේ ප්‍රතිඥාව / දිවුරුම

වර්ෂ දෙදහස් දහහතරක් වූ ජනවාරි මස පළමු වැනි දිනය වන අද දින,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

ලක්වැසි ජනතා අපේක්ෂාවන් යථාර්ථයක් බවට පත් කරන

නව වසරක සමාරම්භය සනිටුහන් කරයි.

අදින් ඇරඹෙන නව වසරේ

එකම රටක්, එකම දැයක් තුළ එක කොඩියක සෙවනේ

එක්සත්ව හා එක්සිත්ව විකසිත වන මාතෘ භූමිය

සංවර්ධනය කිරීමේ දැවැන්ත අභියෝගය ජයගැනීම සඳහාත්

මතු පරපුර උදෙසා ජාතික සමඟිය තහවුරු කරමින්

සමාජ ආර්ථික සංවර්ධනය ඇති කිරීම සඳහාත්

මහජන මුදලින් වැටුප් ලබන රාජ්‍ය සේවකයෙක් වන මම,

රාජ්‍ය ප්‍රතිපත්ති හා අරමුණු ක්‍රියාත්මක කිරීමෙහිලා

මා වෙත පැවරෙන්නා වූ කාර්යභාරය

කාර්යක්ෂමව,

සඵලදායීව,

තිර අදිටනින් යුතුව,

උපරිම කැපවීමෙන්,

අවංක භාවයෙන්,

මහජනතාවට පක්ෂපාතීව,

සපුරා ඉටු කරන බවට ප්‍රතිඥා / දිවුරුම් දෙමි.